**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**POLICE MEDIA DIVISION**
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.02 පැය 1305 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/10/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**විශේෂ රථවාහන මෙහෙයුම සම්බන්ධව - පොලිස් මූලස්ථානය.**

උත්සව සමයේ රථවාහන අනතුරු අවම කර ගැනීමේ අරමුණින් වැඩබලන පොලිස්පතිතුමාගේ උපදෙස් පරිදි විශේෂ රථවාහන මෙහෙයුමක් 2024.12.23 වන දින සිට දිවයිනම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කර ඇත.

2025.01.01 වන දින පැය 0600 සිට 2025.01.02 වන අද දින පැය 0600 න් අවසන් වූ පැය 24 ක කාලය තුල විශේෂ රථවාහන මෙහෙයුම මඟින් බීමත් රියදුරන් 509 දෙනෙකු, අපරීක්ෂාකාරී හා අන්තරාදායක ලෙස රිය පැදවීමට අදාල රියදුරන් 29 දෙනෙකු, අධික වේගයෙන් රිය පැදවීම සම්බන්ධව රියදුරන් 59 දෙනෙකු, මාර්ග නීති උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් රියදුරන් 762 ක්, බලපත්‍ර වැරදි සම්බන්ධ රියදුරන් 345 ක් සහ වෙනත් රථවාහන වැරදි සම්බන්ධයෙන් රියදුරන් 3711 ක් වශයෙන් සමස්ත රථවාහන වැරදි වලට අදාල රියදුරන් 5415 ක් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කර ඇත.

මෙම විශේෂ මෙහෙයුම තවදුරටත් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලබන අතර බීමත්ව රිය ධාවනය නොකිරීමටත්, මාර්ග නීති උල්ලංඝණය ඇතුළු අනෙකුත් රථවාහන නීති රීති උල්ලංඝණය නොකරන ලෙසටත් ශ්‍රී ලංකා පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටියි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**